# වසංගතයක් සඳහා සූදානම් වෙන ක්‍රියා මාර්ග
# කරුනු පත්‍රිකාව

## පීල් මණ්ඩලයේ වසංගත ක්‍රියා මාර්ගය යොමුකරන්නේ පාසැල් සිසුන් සහ කාර්ය මණ්ඩලය අනතුරු නොමැතිව තබා ගැනීමටය

---

***වසංගතයක් කියන්නේ මොනවාද?***

වසංගතයක් කියන්නේ බෝවෙන රෝගයක් ඉක්මනින් පැතිරෙන එකයි. එසේ විය හැකි වසංගතයක් තමයි ප්‍රතිශ්‍යාව උණ(influenza). මෙම වසංගත උණය ඉතාම ඉක්මනින් පැතිරෙන වයිරසයක් මගින් සැදෙන ආශ්වාස ප්‍රශ්වාස පිලිබඳවූ රෝගයකි. එය සිදුවන්නේ අලුත් තදබල උණ වයිරසයක් පැමිණ එය ඉක්මනින්ම පැතිරයාමෙන්ය. මනුෂ්‍යයන් හට මෙම අලුත් වයිරසයට ස්වල්පයක් හෝ කිසිම ප්‍රතිශක්තියක් ඇතිවෙන්නේ නැත.

***මෙම වසංගතය සිදුවන්නේ කවදාද?***

මීලගට වසංගතයක් කවදා වියහැකිද කියන එක අනාවැකි කීමට ඉතා දක්ෂ අයට පුලුවන් කමක් නැත. නමුත් ඉතිහාසය දෙස බැලුවොත්, මෙම වසංගත සිදුවී ඇත්තේ සෑම අවුරුදු සියයකට තුන් හතර වතාවක් පමනකිදිය. ලෝක සෞඛ්‍යය සංවිධානය සහ සාමුහික, පලාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍යය බලමණ්ඩල, වසංගතයකට සූදානම් වෙන ක්‍රියා මාර්ග පිලිබඳ කටයුතු ආරම්භ කර ඇත.

***කොපමන දෙනෙකුට මෙය බලපානවාද?***

දක්ෂ අය කියන්නේ මෙවැනි වසංගතයකදී සියයට 40-60 පමණ ගුරුවරයන් රැකියාවට නොපැමිණෙන බවයි. මෙපමණ දෙනෙක් නොපැමිණෙන හේතුව නිසා පීල් මණ්ඩලයෙන් සලසන සේවයන් අවලංගුවීමට දායක විය හැකිය.

***පීල් මණ්ඩලයේ වසංගත ක්‍රියා මාර්ගය මොකක්ද?***

පීල් මණ්ඩලය වසංගතයක් සඳහා ඉතා හොඳින් සූදානම්ය. 2005-2006 පාසැල් වසර තුලදී මණ්ඩලය, පාසැල් සහ එය හමුවේ වැඩ කරන ආයතන, වසංගතයකට සූදානම් වෙන ක්‍රියා මාර්ගයක් ආරම්භ කර ඇත. මෙම ක්‍රියා මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා මණ්ඩලය, පීල් සෞඛ්‍යය සහ අධ්‍යාපන සහ සෞඛ්‍යය අමාත්‍යාංශ සමගද, මණ්ඩලයේ එක්සත්වූ ගුරුවර සමූහ සහ කම්කරු සමිති සමගත් කටයුතු කර ඇත.

ඔන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්තාවක් සිදුවුවොත්, පීල් මණ්ඩලය මෙම වසංගත ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක කරනවා ඇත. එම අවස්තාවකදී, මෙවැනි අවස්තාවන් සෞඛ්‍යයට කොපමන අනතුරුදායකද කියන එක තහවරු කරගැනීමේ නිපුනත්ව ඇති නිලධාරීන්ගේ උපදේශ සහ මග පෙන්වීම් මණ්ඩලය පිලිපදිනවා ඇත.

වසංගතයකදී අපගේ ප්‍රමුඛතාවය වන්නේ ඔන්ටේරියෝ මහජන සෞඛ්‍යය බලමණ්ඩලයේ උපදේශ අනුව, පුලුවන් තරම්ම අනතුරු නොමැතිව සිටීමට හැකිනම් පාසැල් ඇර තැබීමටය. ගුරුවරයන්ගේ හෝ පාසැල් සිසුන්ගේ සෞඛ්‍යය හෝ ආරක්ෂාවට බලපාන අවස්ථාවක් සිදුවුවොත්, පාසැල් සහ එය හමුවේ වැඩ කරන ආයතන වසා දැමීමට මණ්ඩලය සිතා බලනවා ඇත.

***වසංගතයකදී පුරුදු පරිදි ක්‍රියාවන් නොකඩවා කරගෙන යනවාද?***

වසංගතය ඔන්ටේරියෝ වලින් පිට නම්, පීල් මණ්ඩලය නියමව ඇති සේවයන් පුරුදු පරිදි ලෙස සලසනවා ඇත. එයට පසුව, ඔන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්තාවක් ප්‍රකාශ වුවොත්, මණ්ඩලය <u>වසංගත ක්‍රියා මාර්ගය</u> ක්‍රියාත්මක කරනවා ඇත. මේ නිසා බොහෝ ක්‍රියාවන් කරගෙන ගියත්, එසේ වෙන්නේ ඉතාමත්ම වෙනස් විදියකටය. වසංගත ස්ථිර අවස්තාවකදී ඔන්ටේරියෝ වල පාසැල් විවෘත කර තිබුනාට, නියමව ඇති ක්‍රියා පිලිවෙල සහ සේවයේ මට්ටම් බලාපොරොත්තු ආකාරයට ඇතිකර ගැනීමට බැරිවිය හැක.

***ඔොන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්ථාවකදී මොන ක්‍රියාවන්ද පුරුදු පරිදි නොනවත්වා කරගෙන යන්නේ?***

ඔොන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්ථාවකදී ඉහල සඳහන් ආකාරයෙන්ම බොහෝ ක්‍රියාවන් පුරුදු පරිදි නොනවත්වා කරගෙන යනවා ඇත. මෙම ක්‍රියාවන් කරගෙන යනවා ඇත්තේ බොහෝම වෙනස් විදියකට වෙන අතර, සේවයේ මට්ටම් බලාපොරොත්තු ආකාරයට ඇතිකර ගැනීමට බැරිවිය හැක.  අපි බලාපොරොත්තු වන්නේ පහල සඳහන් ක්‍රියාවන් සුදුසු පරිදිව කිරීමට හැකි නම් එසේ කිරීමටය :

- උපදෙස් දීම, වටිනාකම නිශ්චය කිරීම සහ වාර්තා කිරීම
- පාසැල් සිසුන් තැනින් තැනට ගෙන යෑම - පාසැල් විවෘත කර තිබෙන වේලාවන්වලදී පාසැල් බස් රථ නියම වැඩ සටහන් අනුව ගෙන යෑම
- ළදරුවන් රැක බලාගැනීම - අනතුරුදායක නැතිනම් මෙම ළදරුවන් රැක බලාගැනීමේ ස්ථානවල් විවෘත කර තිබේය
- ඉදහිට උගන්වන ගුරුවරයන් - සුදුසු පාඩම් සහ පාසැල් පරිපාලනය සඳහා ඉදහිට උගන්වන ගුරුවරයන්ව පාසැලට ගෙනීමේ හැකියාව පරිපාලකයන් හට ඇත
- ගෙවීමක් නොලබා වැඩ කරන අය - පිල් පාසැල් වල ස්ථිරව කරන පුහුණු වීම් සෑම වේලාවකදීම පරීක්‍ෂා කරනවා ඇත
- භෝජන ශාලාවල්වල සේවයන් සහ  සත්කාර වැඩ සටහනවල්
- නඩත්තු කිරීමේ සේවයන් - වටා පිටාව උෂ්ණ සහ ශීත කිරීම, ජල නළ වැඩ, විදුලි බලය සහ කොම්පියුටර පිලිබඳ අලුත්වැඩියා
- කුණු කසල එකතු කිරීම
- ආරක්‍ෂාව සඳහා සේවයන් - පාසැල් වසා තිබුනොත් අතිරේක ආරක්‍ෂ සේව මුර සංචාර යොදනවා ඇත
- මණ්ඩල රුස්වීම් - නිතර පවත්වන අතර මෙය ඉලෙක්ට්‍රොනික් මාර්ගයෙන් විය හැක
- බරපතල සිද්ධි වලට අනුකූලතාව දක්වන කණ්ඩායම් - මේවා ක්‍රියාත්මක වූවාට එසේ වෙන්නේ පුරුදු පරිදි ලෙස නොවේය
- උවමනා බඩු ඕඩර් කිරීම
- අභ්‍යන්තර පණිවුඩ සහ මුද්‍රණ කිරීම

***ඔොන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්ථාවකදී මොන ක්‍රියාවන්ද තාවකාලිකව නවත්වන්නේ?***

වසංගතයකදී ජනසමූහයට ඉතාමත්ම උවමනා සේවයන් ලබාදීම සඳහා පහල සඳහන් ක්‍රියාවන් තාවකාලිකව නවත්වනවා ඇත :

- අමතර ක්‍රියාවන්
- පාසැලේ පැවතෙන කෑමට ආදාල වැඩ පිළිවෙල - පීට්සා දින වාගේ
- එළිමහන් ගමන්/චාරිකාවන් - කලින් සකස්කල, පවුල් විසින් කලින් ගෙවා ඇති සෑම එළිමහන් ගමන්/චාරිකාවක්ම අවලංගු වෙනවා ඇත
- පාසැල් මණ්ඩල රුස්වීම් - මූල්ගුරුතුමා පාසැල් මණ්ඩලයේ සභාපති හමුවේ සෑමවිටකදීම සිටිනවා ඇත
- වෘත්තිය දක්ෂතාව සඳහා වැඩිදියුණු ක්‍රියාවන්
- පාසැල් ගුරුවරයන්ගේ රුස්වීම් - රුස්වීම් සඳහා පාසැලෙන් පිටවියයුතු අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ පාසැල් ගුරුවරයන්ගේ රුස්වීම් අවලංගු වෙන අතර මේවා ටෙලිකොන්පරන්ස් මාර්ගයෙන් විය හැක
- පාසැල් වේලාවට පසු ලබාගන්නා අවසර පත්‍ර - පාසැලේ තිබෙන ලෙහෙසි පහසුකම් භාවිතා කිරීමට දැනට තිබෙන සහ අලුත් අවසර පත්‍ර
- තවදුරට අධ්‍යාපනය කරගෙනයාම - රාත්‍රි පාසැල්, වසන්තයේ පාසැල් සහ ජාත්‍යාන්තර භාෂා ක්‍රියා පිළිවෙළ
- සමාජය පාසැල් භාවිතා කිරීම - පාසැල් වේලාවට පසු සමාජ පාසැල් වලින් කෙරෙන ක්‍රියාවන්/භාවිතය
- නිවෙස් වලට ගොස් කෙරෙන පුහුණුව

***ඔොන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්ථාවකදී පිල් මණ්ඩලය කොහොමද ඔවුන්ගේ සේවක සේවිකාවන්ට සහ සමාජයට දැනුම් දෙන්නේ?***

සෑම සේවකයන්, පාසැල් සිසුන්, දෙමව්පියන් සහ සමාජයේ පුද්ගලයන් හට ඉතාම අලුත් ක්‍රියා මාර්ගය ගැන දැන්වීම පිල් මණ්ඩලයේ නොවරදින වගකීමකි.  වසංගත ස්ථිර අවස්ථාවක් ඔොන්ටේරියෝ වලින් පිට හෝ ඔොන්ටේරියෝ වල සිදුවුනොත්, ඊට පෙර සහ පවත්නා කාලය තුලදී විස්තර සහිත නිවේදන මේ සෑම දෙනෙකුටම දන්වනවා ඇත.

මොන්ටේරියෝ වල වසංගත ස්ථිර අවස්තාවකදී මණ්ඩලය ඔබට සෑම තොරතුරක්ම සහ පාසැල් වල තත්වය කුමක්ද කියන එක ප්‍රධාන මධ්‍යස්ථාන දෙකකින් දැනුම් දෙනවා ඇත : පීල් මණ්ඩල වෙබ් සයිට් එක - www.peelschools.org - සහ වසංගත දුරකතන මාර්ගයක්.

ඉදිරියට එන මාස තුලදී අප වසංගතයක් සඳහා සූදානම් වෙන ක්‍රියා මාර්ගය ගැන තව දුරටත් වැඩ කරගෙන යනවා ඇති අතර අළුත්ම තොරතුරු අප ඔබට නොකඩවා දන්වනවා ඇත.